**189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

-----------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

   -----------------

**1.1 මතය**

------

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 33 ක් වෙත සලසා තිබුණු රු.2,866,003,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.769,216,980 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.2,096,786,020 ක් ඉතිරි වී තිබුණි. එම වැය විෂයයන්ගේ ඉතිරි වීම් සියයට 23 සිට සියයට 100 දක්වා පරාසයක විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් පැමිණීම සීමා වීම සහ සැලසුම් කළපරිදි සංවර්ධන සහ අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම අතැති බිල්පත් පියවීමට රු. මිලියන 344 ක් හිඟ හිටීම වැනි කරුණු හේතුවෙන් ඉතිරිවීම් වාර්තාවී ඇත. | උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |
| (ආ) ව්‍යාපෘති අංක 04 හා 05 හි සියලුම වැය විෂයන් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් පමණක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම වැය විෂයන් 43 ක් අතරින් වැය විෂයන් 15 ක් සඳහා වෙන්කර තිබූ රු.19,379,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ඉතිරි වැය විෂයන් 28 ක් සඳහා වෙන් කර තිබූ රු.104,075,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.72,353,151 ක් වූ අතර එම ඉතිරිවීම් සියයට 23 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි. | ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශය 2021.05.03 දින ආරම්භ කළ අතර, අමාත්‍යාංශයට අනුමත පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ නොවීම, නිශ්චිත පරිශ්‍රයක් නොමැති වීම, ආරම්භයේද අමාත්‍යාංශය සතුව වාහන නොතිබීම සහ කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි කටයුතු කිරිමට නොහැකි වීම යන කරුණු මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | -එම- |

**2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන්කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවීම් හිඟ හිට තිබුණ නිලධාරීන් 29 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.1,454,620 ක් විය. ඒ අතර වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව වූ රු.275,827 තුල අවුරුදු 17 ක් පැරණි රු.233,187 ක ණය ශේෂයක්ද වූ අතර සේවය හැර ගිය නිලධාරින්ගේ ණය ශේෂ එකතුව වූ රු.260,148 තුල අවුරුදු 18 ක් පැරණි රු.160,805 ක ණය ශේෂයක්ද විය. | 2022.05.31 දින වන විට රු.417,838 ක් අයකරගෙන ඇති අතර ඉතිරි ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) විශේෂ කාර්ය බලකායේ කලපලුවාව විවාහක නිල නිවාස සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2007 වර්ෂයේදී ගෙවන ලද අත්තිකාරම් මුදලින් මෙතෙක් අය නොවූ රු.4,917,900 ක් අයවිය යුතුව පැවතුණි. | නීති මගින් කටයුතු කරමින් පවතී. | -එම- |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව හඳුනා නොගත් ලැබීම් රු.4,103,052 ක් ද මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු නොකර මාස 06 ඉක්මවූ රු.48,142 ක් වූ චෙක්පත් 06 ක් ද පැවතුණි. | තැන්පතු නිවැරදිව හඳුනා ගනිමින් ගිණුම්ගත කිරීමේ කටුයුත සිදුකරමින් පවතින අතර නිශ්කාශනය නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු කරමින් පවතී. | මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අංක අමප/1610738/703 /033 දරන 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. සාම සාධක රාජකාරී සඳහා නිලධාරීන් යෙදවීම තුලින් විදේශ විනිමය උපයා ගැනීම, නිලධාරීන්ගේ නිපුනතා සංවර්ධනය, ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීම, නිලධාරීන්ගේ ජීවන තත්ත්වය ඉහල නැන්වීම හා නිලධාරීන් අභිප්‍රේරණය කිරීම වැනි කරුණු අරමුණු කරගෙන ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. නිලධාරීන් 320 දෙනෙකුට 2016 වර්ෂයේදී පුහුණුවක් ද ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.1,205,477,623 ක් වැයකර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සාමසාධක රාජකාරී සඳහා එක්වීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | 2021.12.31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉතිරි වාහන හා උපකරණ ගෙන්වීම වෙනුවෙන් රු.මිලියන 771.69 ක් බැඳීම්වලට එළඹ ඇති අතර එම සියළු වාහන සහ උපකරණ කඩිනමින් සපයා අවසන් කිරීමට නියමිතව ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයින් විසින් මිලගට පැවැත්වීට නියමිත පරීක්ෂණය සඳහා නියෝජිත කණ්ඩායම් යොමු කිරීම සඳහා එම සංවිධානය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | අපෙක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |
| (ආ) විශේෂ කාර්ය බලකාය වෙත පැවරෙන රාජකාරී සාර්ථකව ඉටු කිරීමට ප්‍රමාණවත් හා ශක්තිමත් සන්නිවේදන ජාලයක් 2017 – 2020 කාලපරිච්ඡේදය තුල අදියර 4 ක් යටතේ ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සැපයූ උපකරණ වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.159,388,294 ක් ද, භාණ්ඩ නිදහස් කර ගැනීමේ බදු | කඩිනමින් වැඩ අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. | සැලසුම් කළ ආකාරයට අදාල පද්ධති පිහිටු වීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| මුදල් ලෙස රු.55,327,314 ක් ද වැය කර තිබුණි. 2021 දෙසැම්බර් වන විට පළමු අදියර යටතේ වූ සන්නිවේදන ජාලයද සාර්ථකව අවසන්ව නොතිබූ අතර දෙවන, තෙවන හා සිව්වන අදියරයන් සඳහා චීන ණය ආධාර යටතේ ලැබීමට නියමිත උපකරණ හැර තවත් සන්නිවේදන උපකරණ අයිතම 06 කට අයත් ඒකක 894 ක අඩුවක් පැවතුණි. 2021 වර්ෂය අවසාන වන විටත් මෙම අදියර 04 සම්පූර්ණයෙන් අවසන්ව නොතිබීම මත අපේක්ෂිත ශක්තිමත් සන්නිවේදන ජාලය බිහිකිරීමට විශේෂ කාර්ය බලකායට නොහැකිවී තිබුණි. | | |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11 වන ඡේදය අනුව හා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 දිනට පෙර එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත්කල යුතු වුවත් සමාලෝචිත වාර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2022 මැයි මාසය වන විටත් ඉදිරිපත් කොට නොතිබුණි. විශේෂ කාර්ය බලකායේ 2020 වර්ෂයට අදාල භාණ්ඩ අපහරන කටයුතු අවසන්ව නොතිබුණි | විශේෂ කාර්ය බලකායේ අබලි භාණ්ඩ අපහරණය කිරීමට අදාල තක්සේරු මණ්ඩලය සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 සහ මු.රෙ. 756 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2021.06.10 දින අනුමත වූ පසු නිලධාරියෙකු ඉල්ලා සිටියද, නොලැබුණු බැවින් විධිමත් පරිදි අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක නොවුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම මත අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වුණි. | විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත් විය යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 29 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස විවිධ අවස්ථාවලදී ඉල්ලීම් සිදුකර ඇත. | සේවා අවශ්‍යතාමත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විශේෂ කාර්ය බලකායේ පොලිස් කොස්තාපල්/ පොලිස් කොස්තාපල් රියදුරු තනතුරේ අනුමත සංඛ්‍යාව 7,576 ක් වුවද පුරප්පාඩු 2,504 ක් පැවතුණි. එහි ප්‍රතිශතය සියයට 33 ක් විය. | පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා අතිරේක ප්‍රතිපාදන නොලැබීම මත බඳවාගැනීම් සීමා කිරීමට සිදුවිය. | -එම- |
| (ඇ) විශේෂ කාර්ය බලකායේ කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 163 ක් වුවද පුරප්පාඩු 47 ක් පැවතුණි. එහි ප්‍රතිශතය සියයට 29 ක් විය. | -එම- | -එම- |
| (ඈ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන සාමලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | ඉදිරියේදී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්මක් පිළියෙල කල යුතුය. |